**සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම - 2021/ 2022 (ගනුදෙනු පිළිබඳ වාර්තාව)**

සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගමේ 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්වයක් විසින්ම එම අස්ථිත්‍ය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්ය සාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1) (ඈ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙළ කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2007 අංක 07 දරණ සමාගම් පනතේ 150 (1) වගන්තියට අනුව, ශේෂ පත්‍රයේ දින සිට මාස 06 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන පිළයෙළ කිරීම සඳහා වගකිව යුතු පුද්ගලයා විසින් සහතික කරන බවට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සහතික විය යුතුය.

**2.1 මූල්‍ය ප්‍රකාශන**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12/දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාව , රාජ්‍ය සමාගම්වල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන්වී දින 60ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාගම විසින් 2018/2019, 2019/2020, 2020/2021 සහ 2021/2022 යන ගිණුම් වර්ෂයන්ට අදාල මූල්‍ය ප්‍රකාශන 2022 දෙසැම්බර් 16 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2018/2019, 2019/2020 මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු සූදානම් කර ඇත.<br><br>2020/2021 මූල්‍ය ප්‍රකාශන 2022 දෙසැම්බර් මස 30 දිනට ප්‍රථම ඉදිරිපත් කිරීමට උපදෙස් ලබා දී ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව නියමිත දිනට ගිණුම් ඉදිරිපත් කළ යුතුය. |

## 2.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41(2) (උ) වගන්තිය | 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන සහ ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් විසින් දරනු ලබන සමාගම් සඳහා විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවිය යුතු වුවත් සමාගම විසින් එම නියමය ප්‍රකාර කටයුතු කර නොතිබුණි. | නව අධ්‍යක්ෂ මණ්ඩලය පත්වූ විගස විගණන කළමනාකරණ කමිටු පිහිටුවා කටයුතු කිරීමට උපදෙස් ලබා දෙන ලදී. | විගණන පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය | | | |
| (i) | 5.2.3 හා 4 ඡේදය | සමාගම විසින් වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කර අනුමත කර නොතිබුණි. | 2023 වර්ෂයට අයවැය ඇස්තමේන්තුව සකස් කර ඇති අතර, එය අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට උපදෙස් ලබා දී ඇත. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | 6.5 ඡේදය | සමාගම විසින් වාර්ෂික වාර්තා පිළියෙළ කර පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි. | වාර්ෂික වාර්තා සකස් කරමින් පවතී. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) | 8.3.4 හා 8.3.5 ඡේද | සමාගමට අයත් පරිගණක පාසලේ ස්ථිර හා අනියම් කාර්ය මණ්ඩලය වෙනුවෙන් 2021 මැයි සිට ඔක්තෝම්බර් දක්වා දුරකථන දීමනා සහ ඉන්ධන දීමනා ලෙස එකතුව රු.60,821ක් යොමුගත චක්‍රලේඛයට පටහැනිව ගෙවා තිබුණි. | කොවිඩ් කාලය තුළ පරිගණක පාසලේ කටයුතු සිදුකළ අතර ,ඔහු ගාල්ලේ සිට ගමන් ගත් බැවින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි ප්‍රවාහන දීමනා ලබා දෙන ලදී . | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2014 පෙබරවාරි | සංයුක්ත සැලැස්මක් සහ වාර්ෂික | 2022 සිට 2026 දක්වා | චක්‍රලේඛ උපදෙස් |

| | | | |
|---|---|---|---|
| 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර අධ්‍යක්ෂ මණ්ඩලය මගින් අනුමත කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සංයුක්ත සැලැස්ම සකස් කරමින් පවතින අතර, 2023 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත. එය අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට උපදෙස් දෙන ලදී. | ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| (i) 3.4.3 (අ), (ආ), (ඇ) හා (ඈ) ඡේද | සමාගම විසින් 2020/2021 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට කටයුතු නොකර ඊට පටහැනිව අපනශාලාවේ මිලදී ගැනීම් සඳහා රු. මිලියන 3ක් වැය කර තිබුණි. | රජයේ ප්‍රසම්පාදන කටයුතු සමාගමට අනුගමනය කිරීමට අපහසු වන බවත් , සමාගමට ලැබෙන ඇණවුම් හදිසි අවශ්‍යතාවය මත සිදුවන බැවින් ආපනශාලාවට අදාළ මිල දී ගැනීම් සිදු කිරීමේ දී ණය පදනම මත ලබා දීමට එම ආයතනය එකඟතාවය එල නොකරන බැවින් අත්පිට මුදලකට මිල දී ගැනීමට සිදුවන බවද දන්වමි. | මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) 4.2.1 (අ) ඡේදය | සමාගම විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ඉදිරියේ දී සමාගම සඳහා උචිත ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කරන ලෙස උපදෙස් දෙන ලදී . | මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේදී ජාතික තරුණ සේවා සභාවට සේවා සැපයීම තුළින් රු. මිලියන 10.2ක ආදායමක් උපයා තිබුණද එය අපේක්ෂිත ආදායමෙන් සියයට 5.4 ක් විය. එමෙන්ම සමාගමේ මුද්‍රණාලයේ 2018 වර්ෂයේදී රු. මිලියන 17ක්ව පැවති වාර්ෂික ආදායම 2021 වර්ෂය වන විට රු. මිලියන 5.6 ක් දක්වා අඩු වී තිබුණි. එය ප්‍රතිශතයක් ලෙස සියයට 66 ක අඩු වීමක් වන අතර සමාගමේ මුද්‍රණාලයේ ආදායම් | රටේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය මත මුද්‍රණාලය විටින් විට වසා තැබීමට සිදු වූ අතර, නිසි පරිදි රාජකාරී කටයුතු සිදු කිරීමට නොහැකි වූ බවත් දැනට පවතින මුද්‍රණ යන්ත්‍රයෙන් ඉලක්කගත ආදායම්කරා යාමට අපහසු බැවින් නවීන මුද්‍රණ යන්ත්‍රයක් මිල දී ගැනීමට අපේක්ෂා කරන අතර, | ආදායම ප්‍රවර්ධනය කර ගැනීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වැඩිකර ගැනීම සඳහා කළමණාකරණය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | එමඟින් මුද්‍රණාලයේ ආදායම ඉහළ නංවා ගැනීමට සැලසුම් කර ඇත. | |
| (ආ) | \සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගමේ ආරක්ෂක නිලධාරීන්ගේ 2020 වර්ෂයේ පෙබරවාරි සිට දෙසැම්බර් දක්වා හිඟ වැටුප් ගෙවීම සඳහා ජාතික තරුණ සේවා සභාව විසින් 2021 ජූලි මස රු.මිලියන 6ක් මුදලක් ලබාදී තිබුණද ,එම මුදල නිලධාරීන්ගේ හිඟ වැටුප් ගෙවීම සඳහා යොදා නොගෙන සමාගමේ ආපන ශාලාවේ පාරිභෝගික භාණ්ඩ මිලදී ගැනීම සහ ආයතනික පරිපාලන වියදම් පියවා ගැනීම සඳහා යොදාගෙන තිබුණි . | ආයතනයේ මූල්‍ය තත්ත්වය මත එම මුදලින් ආපනශාලා බිල්පත් සහ පාරිභෝගික භාණ්ඩ මිල දී ගැනීමක් සිදුකර ඇති බව දන්වා සිටින අතර, ඉදිරියේ දී එසේ සිදු නොකිරීමට උපදෙස් දෙන ලදී. | අදාල නිලධාරීන්ගේ හිඟ වැටුප් ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම යටතේ 2021 සැප්තැම්බර් 21දින පරිගණක පාසලක් ආරම්භ කර තිබුණ අතර එම පාසැලට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව නිලධාරින් 10 දෙනෙකු බඳවාගෙන 2021 මැයි සිට ඔක්තෝබර් 31 දක්වා වැටුප් හා දීමනා වශයෙන් ගෙවා තිබූ රු. මිලියන 2ක් සමග පරිගණක පාසලට රු. මිලියන 4.1ක සමස්ථ වියදමක් සමාගම විසින් වැයකර තිබුණද පරිගණක පාසල මේවන විට ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබුණි. | සමාගමේ කටයුතු වෙනුවෙන් කිසිදු අවස්ථාවක කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නැත. පරිගණක පාසල ආරම්භ කර ඊට අදාළ කාර්ය මණ්ඩලයක් බඳවා ගත් අතර, ඔවුන් යොදා පරිගණක පාසලේ අදාළ පාඨමාලා ව්‍යාපෘති ඇතිකර එමඟින් ආදායමක් ඉපයූ අතර, පසුව මෙම ව්‍යාපෘතියේ නිළධාරීන් කොටසක් ජාතික තරුණ සේවා සභාව වෙත අනුයුක්ත කර ගන්නා ලදී. ඉන්පසුව සමාගමේ පරිගණක පාසල පවත්වා ගෙන යාමට අදාළ කටයුතු සිදු නොකරන ලදී. | නව ව්‍යාපෘතින් ආරම්භ කිරිමේදි අපේක්ෂිත අරමුණු ඉටුවන ආකාරයෙන් සැලසුම් සහගතව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | සමාගමේ මුද්‍රණාලයේ 2021 දෙසැම්බර් 31දිනට ජාතික තරුණ සේවා සභාවෙන් හා බාහිර ආයතනවලින් ලැබිය යුතු එකතුව රු.මිලියන 16.4 ක ණය ශේෂයක් පැවති අතර එම ණය ශේෂය තුල අවුරුදු 5ට වඩා වැඩි රු.මිලියන 14.1 ක ශේෂයක් විය .එම ණය ශේෂය අයකර ගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි. | දැනටමත් ඒ සම්බන්ධව සොයා බලා ශේෂ අයකර ගැනීමට කටයුතු සිදු කරමින් පවතී. | ණය ශේෂය අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2021අප්‍රේල් 01 දින සමාගමට අයත් නොවන තරුණ සේවා සභාවේ මාතලේ තරුණ මධ්‍යස්ථාන භූමි කොටසකට අදාලව වැටක් ඉදිකිරීම සඳහා සහ සමාගමේ ආරක්ෂක සේවා සැපයීම් ආයතන පිළිබඳ නිරීක්ෂණ චාරිකාවක් සඳහා කළමනාකරණ අධ්‍යක්ෂක වෙත ගෙවා තිබුණු රු.100,000ක දීමනාවක් සඳහා අදාළ උපයෝගී ලියවිලි හා වියදමට අදාළ අනුමැතියක් විගණය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | එවකට සිටින ලද සභාපතිතුමාගේ උපදෙස් මත කළමනාකාර අධ්‍යක්ෂ විසින් මෙම මුදල් ප්‍රමාණය ලබා ගෙන ඇති අතර, මේ දක්වා පියවීම් සිදු කර නොමැත. එම මුදල් අය කර ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. | අදාල මුදල් අප්‍රමාදව පියවීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඊ) කිසියම් විශේෂිත කාර්යක් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරින්ට පමණක් එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමයක් දක්වා තත්කාර්යය අතුරු අග්‍රිම ලබා දීමට හැකි අතර එම කාර්ය නිමකල විගස අග්‍රිමය පියවිය යුතු වුවත් ,ඊට පටහැනිව සමාගම විසින් අවස්ථා 08ක දී රු.100,000 ඉක්මවූ එකතුව රු. මිලියන 1.6 ක් වූ අත්තිකාරම් ලබා දී තිබුණි. එමෙන්ම අත්තිකාරම් පියවීමේදී අවස්ථා 19කදී එකතු වටිනාකම රු. මිලියන 2 ක් වූ අත්තිකාරම් මාස 03ත් දින 22ක් අතර කාලයක් ප්‍රමාද වී පියවා තිබුණි. | අදාළ අත්තිකාරම් මුදල් ලබා ගෙන වැඩසටහනට අනුව වෙනත් නිළධාරීන් ලවා ආහාර නිකුත් කිරීමට උපදෙස් ලබා දුන් අතර, ආපනශාලාවේ සියලු සේවකයින් සේවයට වාර්තා කිරීමක් සිදු කර නොමැත. | අතුරු අග්‍රිම අදාල සීමාවන්ට යටත්ව ලබා දීමටත් එම කාර්ය නිමකල විගස අග්‍රිමය පියවීමටත් කටයුතු කළ යුතුය. |